# රන් ස්වරයාණන් නිහඬ විය



සුළං කුරුල්ලෝ ගලවා පියාපත්
සුදු පැහැති
විසිකළා පොළොවට
ඔබ ගිය මග පාර දිගේ
මල් සුවඳ නොව මිනිස් සුවඳට
ඉව අල්ලා
ජීවිතය මියුරු සර ගීතයක් කළ

බඹරු ඇවිත් නොතලා මල්
නොඋරා රොන්
නෙලාගත් මල
තැබුවා ඔබේ දෙන අසළ
වයා වෙණ තත්
සැබෑ බඹරුන් ලොවට පෙන්නූ
රන් ස්වරයේ වරුණ කියමින්

දම්මි සුගත් වෙනස් වී ඇත
කාලය සමගින්
එහෙත් ඔබ වැයූ වෙණ තත
ගොළු හදවත් නලවා
නොවෙනස් ව ඇසෙන රාවය
ආදර හසුන්පතටත්
එස් එම් එස් තිරයටත් පොදුයි
අසා සිටී අදත් ඒ පරපුර
සදාතනිකයි
නොමියෙන බව දනිමින්

අඳුරු කුටිය තුළ දොරගුළු හැරලූ
පැල්පතේ කම්හලේ
ගොවිපොළේ දෙවියෝ
ගිනියම් අව්වද මහ වරුෂාවද
උණුකඳුළු කර
වැලපුනා රන් ස්වරයේ දෝංකාරය අසල

අහස් ගව්වෙන් ඔබ්බට ගිය
ඔබේ  නින්නද ස්වරය
මගේ හදවත ලෙසින් ඔබ
අඳුනාගෙන ඔබ මා ලෙස
මහ මුහුදම  ගොඩට ගලා
රත්වුණු හිරු පායන දවසටත්
හරිම සිසිලසයි

සීත රෑ යාමේ අඳුරේ
සුමුදු සයනේ
සිනිදු ඇතිරිල්ලක නිදන
ඔබ රුව දකින්නට
අපි බලාසිටින්නෙමු දිවා රෑ

උපදින්න මියුරු සර
ගිම්හානයේ රතු පාට හිරු යට
වසන්තයේ දවසක් ලෙසින්
නාඳුනන සිහිනයක් විලසින්වත් වින්
අග්නියේ සිහිල් දිය බිඳුව ලෙස
මානස විල මැද
නැවත රඟන්නට

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

